ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකල මතය

ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන්අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) පුනරාවර්තන හා මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාල පුනරාවර්තන හා මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණ විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු වෙනුවෙන් වැය ශීර්ෂයන් 59 කට අදාළව රු.36,243,028 ක් වැය කර තිබූ එම වියදම් සඳහා වැය ලෙජර් පවත්වා නොතිබුණි. | සටහන් කිරීම අතපසු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයන් කාණ්ඩගත කර ප්‍රමිත කර ඇති ආකාරයට ගිණුම්ගත කල යුතුය. |

### (ආ) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව උපරිම වියදම් සීමාව රු.35,000,000 ක් වුවත්, දෙපාර්තමේන්තු පොත් අනුව | 2022 දෙසැම්බර් 31 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | සමාලෝචත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර අදාල සීමාවන් ඉක්මවීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාගත යුතුය. |

රු.35,395,000 ක් වූයෙන් උපරිම වියදම් සීමාව රු.395,000 ක් ඉක්මවා තිබූ අතර ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ රු.2,403,558,971 ක් වුවත්, ඉදිරිපත් කර තිබුණු උපලේඛනය අනුව එම ශේෂය රු.2,403,947,171 ක් වූ අතර, අපහරණය කළ රු.388,200 ක් වූ ස්ථාවර වත්කම් උපලේඛනයෙන් ඉවත් කර දක්වා නොතිබුණි. | තාක්ෂණික දෝෂයක් මත මඟහැරී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු, උප ලේඛන සමඟ සසඳා ඉදිරිපත් කලයුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 1.3.4 ඡේදය ප්‍රකාරව මොණරාගල, තණමල්විල හා කතරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් රජයේ ඉඩමක් ලබා ගැනීමට සුදුසු තැනැත්තන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | ඉදිරියට යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | ලේඛන යාවත්කාලීනව හා නිවැරදිව පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට මිය ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය එකතුව රු.1,210,053 ක් වූ අතර ඉන් එකතුව රු.1,011,393 ක් වූ ණය ශේෂ 02 ක් වර්ෂ 05 ට අධික කාලයක සිට අය නොවී පවතින ණය ශේෂ විය. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ණය මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලද රු.60,284,140 ක ප්‍රතිපාදන මත සියඹලාණ්ඩුව සූර්ය විදුලි උත්පාදනාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.51,879,639 ක වටිනාකමකට පුද්ගලික සමාගමක් සමඟ 2022 අගෝස්තු 03 දින ගිවිසුම් අත්සන්කර තිබුණි. විගණිත දිනය වූ 2023 පෙබරවාරි 17 දින වන විට අදාළ කොන්ත්‍රාක්කාර සමාගමට රු.27,659,353 ක් ගෙවීම් කර තිබුණි.ගිවිසුම් ප්‍රකාරව ඉහත කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් 29 දිනට පෙර නිමකළ යුතු වුවත්, සාධාරණ හේතුවකින් තොරව ඉතිරි ඉදිකිරීම් කාර්යයන් සිදු කිරීමට කටයුතු නොකර 2023 පෙබරවාරි 16 දින වනවිට කර්මාන්තය අතරමඟ නවතා දමා තිබුණි. | ව්‍යාපෘතියට අවශ්‍ය ඉන්ධන සපයා ගැනීම හා අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාද වී ඇත. ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත් වුවහොත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කරමි. | ගිවිසුමේ නියමයන් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2020 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.1,992,285 ක් වැයකර තිබුණු අතර, ගොඩනැගිල්ල ඉදිකර වසර 2 ක කාලයක් ගත වී තිබුණද, විගණන දිනය වූ 2022 නොවැම්බර් 15 දින වන විටත් අරමුණුගත කාර්යන් සඳහා යොදා ගෙන නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල අරමුණගත කාර්ය සඳහා යොදා ගැනීම පිළිබඳ අධීක්ෂණය කිරීමට වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ වෙහෙර යාය රන්ලිය ව්‍යවසායකත්වය සංවර්ධන පදනම සඳහා රු.1,925,569 ක ගිවිසුම්ගත වටිනාකමකට රටකජු සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද 2022 නොවැම්බර් 15 දින වනවිට වසර 02 කට වැඩි කාලයක සිට, අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | ගොඩනැගිල්ල රන්ලිය ව්‍යවසායකත්ව පදනම වෙත භාරදීමට සියලු කටයුතු සකස් කර ඇත. | ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පිහිටුවීම මඟින්, ජාතික නිෂ්පාදනය වැඩිකිරීම, ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා විකල්ප ආදායම් මාර්ග ඇතිකිරීම, විරැකියාව අඩුකිරීම, දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීම වැනි අරමුණු ළඟාකර ගැනීමට අපේක්ෂා කර තිබුණද, වැල්ලවාය හා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.5,479,380 ක් වැයකර උපකරණ මිලට ගෙන බෙදාදීම පමණක් සිදුකර තිබුණද ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | රටේ පැවති අයහපත් තත්ත්වය මේ සඳහා හේතුවිය. | අවශ්‍යතාවයන් සහ නියමිත ප්‍රතිලාභීන් හඳුනාගෙන උපකරණ ලබාදීමට කටයුතු කළ යුතු වේ. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස සන්තකය ආපසු ගැනීමේ පනත | | ගිවිසුම්ගත කාලය අවසන් වුවද, නැවත භාර නොදුන් රජයේ නිවාස 03 ක් යොමුගත පනතේ රෙගුලාසි ප්‍රකාරව නැවත පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අංක 64/4 නිල නිවාසය පවරා ගැනීමට පිස්කල් නියෝග ක්‍රියාත්මක කිරීමට 2023 අප්‍රේල් 26 දිනට දින නියම කර ඇත. අංක 28/59 නිල නිවාසය පවරා ගෙන ඇත. අනෙත් නිල නිවාසය කඩිනමින් භාර දෙන ලෙස දැනුම් දී ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව රජයේ නිවාස නැවත පවරා ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 104 (4) | 541,250 | අලාභ හානි සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කලයුතු බව දක්වා තිබුණ ද, 2021 හා 2022 වර්ෂයේ සිදු වී තිබුණු වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | කමිටු වාර්තා ලැබී ඇති අතර ඒ අනුව කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 206 (1) | 1,204,667 | තැන්පත් ගෙවීම් සඳහා සෑම වවුචරයක්ම නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ | පිළිගනිමි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | නිලධාරීන් දෙදෙනෙකු සහතික නොකර ගෙවීම් කර තිබුණු අවස්ථා නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | |
| (iii) | මුදල් රෙගුලාසි 237 (අ) (i) හා (ආ) | 11,738,374 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කතරගම හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිලදී ගැනීම් සඳහා ගෙවීම් කිරීමේදී කාර්යාල වෙත ලැබී නොතිබුණු භාණ්ඩ සඳහා ගෙවීම් කර තිබුණි. | පිළිගනිමි. රටේ පැවති අයහපත් තත්ත්වය නිසා උග්‍ර භාණ්ඩ හිඟය පැවති බැවින් මෙම තත්ත්වය ඇතිවිය. | මුදල් රෙගුලාසි නියමයන් ප්‍රකාරව කටයුතු කළයුතුය |
| (iv) | මුදල් රෙගුලාසි 1646 | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාළ වාහන 30 ක 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ ධාවන සටහන් 2023 පෙබරවාරි 28 දින වන විටත් විගණන සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක වාහන 30 ක් සඳහා අදාල ධාවන සටහන් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කලයුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>---------------------- | | | | |
| (i) | XIX වැනි පරිච්ඡේදයේ 6.2 ඡේදය | 189,000 | රජයේ නිවාසයක් රජයේ නිලධාරියකුට පමණක් වෙන්කර දියහැකි වුවද, ඊට අනුකූල නොවී වරිපනම් අංක 28/49 දරන රජයේ නිවාසය 2017 සැප්තැම්බර් 25 දින සිට මාසිකව රු.3,000 ක කුලියකට තාවකාලික පදිංචිය සඳහා පුද්ගලික ආයතනයක සේවය කරන ඉංජිනේරුවරයෙකුගේ පදිංචිය සඳහා ලබා දී තිබුණි. | මෙම ඉදිකිරීම් සමාගමේ ඉල්ලීම මත නිවාස කමිටුවේ අනුමැතිය සහිතව එම ආයතනය වෙත ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කලයුතුය. රු.300 කුලිය සාධාරණ, වෙනස අයකර ගතයුතු ජලය, විදුලියද අයකර ගත යුතුය. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

----------------------------

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛය | | දෛනික ධාවන සටහන් වෙනුවට චක්‍රලේඛයේ ඇමුණුම 02 පරිදි සටහනක් පවත්වාගෙන යා යුතු වුවත්, නිල වාහන 05 ක් සම්බන්ධයෙන් එම සටහන් පවත්වා නොතිබුණි. | වාහන 02 ක් සඳහා 2023 වර්ෂයේදී ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. මොණරාගල, මැදගම හා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව දෛනික ධාවන සටහන් වෙනුවට අදාල ආකෘති ප්‍රකාරව ධාවන සටහන් පවත්වා විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | | ආයතනයේ කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඉහල නංවා ගැනීම සඳහා ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සිදුකළ යුතු වුවද, 2021 හා 2022 වර්ෂවලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 ජනවාරි මාසය තුල කාර්ය සාධන ගිවිසුම් ලබාගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කාර්ය මණ්ඩල කාර්යය සාධන ගිවිසුම් වලට එළඹිය යුතුය. |

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

--------------------------

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 8.9.1 (ආ) ඡේදය | 48,664,675 | වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වැල්ලවාය, කතරගම, මොණරාගල හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අදාල වටිනාකම ඉක්මවූ මිලදී ගැනීම් වලදී විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ඉදිරියේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර මිලදී ගැනීම් සිදුකරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | 1.3.2 වගන්තිය | 3,076,820 | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගැනීම් සිදුකිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටයුතු කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | පිළිගනිමි ඉදිරියට සෘජු මිලදී ගැනීම් සිදුකිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතුය. |
| (iii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය හා ඊට අදාල සංශෝධනයන් | 51,800,044 | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සඳහා අධිකාරී සීමාව රු.මිලියන 01 ක්ද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සැපයුම් කටයුතු සඳහා අධිකාරී සීමාව රු.මිලියන 10 ක් වුවද, එම සීමාව ඉක්මවා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වැල්ලවාය, කතරගම ,මොනරාගල හා බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් උපකරණ මිලට ගැනීම උපකොටස් වලට බෙදා සිදුකර තිබුණි. | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බිංදු ජල හා විසිරි ජල පද්ධති මිලදී ගැනීම සඳහා වැයකල රු. 1,989,814 ක් වැය කිරීම පිළිගනිමි. වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිලදී ගත් ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර 29 ක් මිලදී ගැනීම සඳහා රු.1,991,000 සඳහා දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව මිලදී ගත්තෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 හා 2022 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කෝමාරිකා වගා ව්‍යාපෘතිය සඳහා රු.3,776,390 ක් වැය කර තිබුණි. කෝමාරිකා පැල මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා රු.1,697,090 ක් වැය කර තිබුණද, කෝමාරිකා පත්‍ර නිෂ්පාදනයේ අස්වනු නෙලීමේ කාලය එළඹ තිබුණද, පත්‍ර එලදාව මිලදී ගැනීමට ගැනුම්කරුවන් නොමැතිවීමෙන් හා සරු එලදාවක් | ගැණුම්කරුවන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දී ඇත. | කෝමාරිකා පත්‍ර නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳපොලක් හඳුන්වා දීමට හා වගා හානි වැළැක්වීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබීමෙන් වගාකරුවන් වගාව අත්හැර දැමීමට නැඹුරු වී තිබුණි.<br>තවද දිලීර රෝග වැලදී කෝමාරිකා පත්‍ර විනාශවී යන ස්වරූපයක් පවතින බව සංවර්ධන නිලධාරී වාර්තා හා ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | |
| (ආ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ පවතින අරමුදල් පරීක්ෂාවේදී 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශ 11 ක් තුළ ග්‍රාමශක්ති ජනතා සමිති 125 ක් පැවති අතර එම සමිති සතු බැංකු ගිණුම් හි රු.81,968,386 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. | අරමුදල් නැවත රජය වෙත පවරා ගන්නා ලෙස දැනුවත් කරමි. | රාජ්‍ය මුදල් ඵලදායී හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිහිටි දීමනා හා ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ දීමනා ගෙවීමේදී රු.1,101,900 ක් ප්‍රතිලාභීන් වෙත ලබා නොදී 2022 දෙසැම්බර් 31 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ආපසු එවා තිබුණි. | ඉතිරි මුදල් එම මාසයේම ගෙන්වා ගැනීමට ජාතික වැඩිහිටි මහ ලේකම් අධ්‍යක්ෂකගේ අංක NSENDVENO3/01/01 හා 2022 දෙසැම්බර් 06 දිනැති ලිපියෙන් උපදෙස් ලැබී ඇත. | ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනා ගැනීම සහ අවශ්‍ය ප්‍රමාණයට මුදල් ගෙන්වාගෙන ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතුය. |
| (ඈ) | ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් 302 දෙනෙකුට මහ කන්නයේ වගා කිරීම සඳහා මුං හා උඳු බීජ කිලෝග්‍රෑම් 2754 ක් මිලදී ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.2,889,120 ක් වැය කර තිබුණි. නියමිත කාලය ප්‍රමාද වී බීජ ලබාදීම නිසා තණමල්විල හා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රතිලාභීන් 80 දෙනෙකු රු.331,170 ක් වටිනා මුං හා උඳු බීජ කිලෝග්‍රෑම් 317.265 ක් භාවිතයට ගෙන නොතිබුණි. | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය කොට්ඨාශයේ - 2022/23 මහ කන්නයේ වගා කිරීමෙන් පසු මුං හා උඳු බීජ ලබාදීමට සිදුවිය. මේ වන විට එම බීජ වගා කර ඇත.<br>තණමල්විල ප්‍රාදේශිය කොට්ඨාශයේ - ප්‍රමාද වී බීජ ලැබීම නිසා ප්‍රතිලාභීන් එම බීජ වගා නොකර තිබූ අතර ගොවීන් පස් දෙනෙකුගේ වගාවන් අසාර්ථක වී ඇත. | නියමිත කාල වකවානුවලදී වගාවන් සඳහා අවශ්‍ය බීජ ලබාදීමට ක්‍රියා කළයුතුය. |

## 3.2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සාම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත ගම්මාන සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන - 2021 යටතේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොලොන්වින්න පන් කර්මාන්ත ගම්මානයක් සංවර්ධනය කිරීම සඳහා රු.2,390,641 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතිය යටතේ රු.853,000 ක් ඇස්තමේන්තු කර පන් කර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ අලෙවිහලක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණද, විගණන දිනය වූ 2022 දෙසැම්බර් 20 දින වන විටත් අදාළ ඉඩම මැනුම් කිරීම සඳහා ඉල්ලීම කිරීම පමණක් සිදුකර තිබුණි. | මෙම ඉල්ලීම කඩිනමින් ඉටුකල නොහැකි බව මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇත. | රාජ්‍ය මුදල් ඵලදායීව හා කාර්යක්ෂමව ලෙස උපයෝජනය කර ජනතාව සමෘද්ධිමත් කළයුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන ලේඛනයේ ඇතුළත්ව නොමැති වාහන 06 ක් අනතුරුවීම හෝ වෙනත් හේතූන් මත ධාවනයෙන් ඉවත් කර කාර්යාල පරිශ්‍රය තුළ විනාශ වෙමින් පැවතුණ අතර, නිලධාරීන් වෙත භාර දී තිබූ යතුරුපැදි 06 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ආපසු භාරදීමෙන් පසු එම යතුරුපැදිවල කොටස් අස්ථානගතව තිබුණි.<br>එම කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන 02 ක් සම්බන්ධයෙන් නඩු විභාග වෙමින් පවතී. 150-1638 යතුරුපැදිය ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා යොමු කර ඇත. යතුරුපැදි දෙකක් සෞඛ්‍ය, මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශයටත් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයටත් අයත්ය. | වාහනවල අයිතිය නිවැරදිව හඳුනාගෙන විධිමත් පරිදි අපහරණය කිරීමට හා යතුරුපැදි කොටස් අස්ථානගතවීම සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ පැවැත්වීමට ක්‍රියා කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ලේඛනගත ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන 08 ක් සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | යතුරුපැදි 04 ක්,ජල බවුසර් 01 ක්, පැජරෝ ජීප් රථ 02 ක් සහ ඩබල් කැබ්රථ 01 ක් අපහරණය කිරීම සඳහා දන්වා ඇත. අංක තහඩු නොමැති ඩබල් කැබ්රථය සඳහා නඩු විභාගයක් පවතී. ලොරි රථය හා බවුසරය සඳහා ලියාපදිංචි සහතිකය ලබා ගැනීමට කටයුතු කරමි. | රජයට උපරිම වාසි සිදුවන අයුරින් වාහන අපහරණය කිරීමට කටයුතු කලයුතුවේ. |

**3.4 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නිවාස කුලී අඩුවෙන් අය කිරීම හේතුවෙන් නිලධාරීන් 58 දෙනෙකුට අදාළව රු.708,030 ක් වූ නිවාස කුලී 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් හිඟව පැවතුණි. | 2023 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු අයකල මුදල රු.69,999 කි. තවදුරටත් අයවිය යුතු හිඟ මුදල රු.638,056 කි. | හිඟ නිවාස කුලිය කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කළයුතුය. |
| (ආ) | කතරගම, මොණරාගල සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2019 සිට 2022 වර්ෂය දක්වා විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ මිලදී ගෙන තිබුණු රු.1,588,473 ක් වටිනා භාණ්ඩ ඒකක 1,411 ක් විගණන දිනය වූ 2022 දෙසැම්බර් වන විටත් අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ගබඩාවල රඳවාගෙන තිබුණි. | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පිලිගනිමි මේ වන විට සීලර් යන්ත්‍රය, ගෑස් ලිප හා බ්ලෙන්ඩරය ප්‍රතිලාභීන් වෙත බෙදා දී ඇති අතර අනෙකුත් උපකරණ හැකි ඉක්මනින් ප්‍රතිලාභීන් වෙත බෙදා දෙමි.<br>මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මැතිවරණ කාල සීමාව පසුව බෙදා හැරීමට ක්‍රියාමාර්ග ගනිමි. | අවශ්‍යතාවය නියමිත පරිදි හඳුනා ගෙන භාණ්ඩ මිලදී ගැනීමට සහ ප්‍රතිලාභීන්ට සුදුසු භාණ්ඩ බෙදාදීමට ක්‍රියා කළයුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 22 දින වන විට මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු ඉඩම් බලපත්‍ර (අවසර පත්‍ර) 69 ක්ද, 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු දීමනා පත්‍ර 50 ක් ද අදාළ දීමනාපත්‍ර/බලපත්‍ර ලාභීන්ට | ඉඩම් කච්චේරි වලදී දීමනා පත්‍ර බෙදා දීමට කටයුතු කරමි. | දීමනා පත්‍ර හා බලපත්‍ර ප්‍රමාදයකින් තොරව අදාල පාර්ශවයන් වෙත ලබාදීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදීමට කටයුතු නොකර කාර්යාලයේ රඳවාගෙන තිබුණි. | | |
| (ඈ) | වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 29 හි බලපත්‍ර ඉඩම් සඳහා දීමනා පත්‍ර 2543 ක් සකස් කිරීමට අදාළව, 2015 සිට 2019 වර්ෂවල මොනරාගල ජ්‍යෝෂ්ඨ මිනින්දෝරු අධිකාරී කාර්යාලය වෙත මැනුම් ඉල්ලීම් ලිපි යවා තිබුණ ද, 2022 නොවැම්බර් 15 දින වන විටත් එම කටයුතු සිදු වී නොතිබුණු අතර ඒ සඳහා එම ඉල්ලීම් ලිපි යැවූ දිනයෙන් පසු, පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. | මෙම මැනුම් ඉල්ලීම සම්බන්ධයෙන් සිහිකැඳවීම් යැවීමට කටයුතු කරමි. | පසු විපරම් සිදුකර මැනුම් කටයුතු ක්‍රියාත්මක කර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ඉ) | බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයන් දහදෙනෙකු සඳහා එකතුව රු.2,084,790 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, එම මුදලින් 2022 දෙසැම්බර් 31 දින වනවිට තවදුරටත් රු.1,168,365 ක් අයවිය යුතුව තිබුණි. | පිළිගනිමි. වැඩිපුර ගෙවූ මුදල් නැවත අයකර ගැනීම සිදු කෙරේ. | වැඩියෙන් ගෙවා තිබුණු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු අතර වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඊ) | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2016 ජුලි 14 දිනැති සියලු ප්‍රාදේශීය ලේකම්වරු අමතන ලද ලිපිය අනුව ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය (eslim) යටතේ ඉඩම් පිළිබඳ දත්ත 2016 ඔක්තෝබර් අවසාන වන විට රැස්කර අවසන් කළයුතු බවට ඉලක්ක ලබා දී තිබුණද, කතරගම ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයෙන් පසුවත්, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයෙන් පසුවත් මෙම පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ඉඩම් පිළිබඳ දත්ත රැස්කර තොරතුරු පද්ධතිය යාවත්කාලීන කළයුතුය. |
| (උ) | 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනතට අදාළ නියෝග අංක 179 අනුකූලව අස්කිරීමේ දැන්වීමකින් බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩම් | අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම් කොටස නිශ්චිත වන රජයේ ඉඩමක් නම් රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරමි. | ඉඩම්වල සන්තකය පවරා ගැනීමට කඩිනමින් ක්‍රියා කළයුතුය. |

03 ක ඉඩම් නිරවුල් සන්තකය ලබා ගැනීමට විගණන දිනය වූ 2023 ජනවාරි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක අනුමත සේවක සංඛ්‍යා විස්තරය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 14 ක්, තෘතියික ශ්‍රේණියේ තනතුරු 19 ක්, ද්විතියික ශ්‍රේණියේ තනතුරු 156 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 17 ක්ද වශයෙන් එකතුව තනතුරු 206 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත. | සේවක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවරයන් ගතයුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා විස්තරය අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක ද්විතියික ශ්‍රේණියේ සේවකයින් 215 ක්ද ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් 02 ක්ද අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අතිරික්තව පැවතුණි. | නිලධාරීන්ට වාර්ෂික ස්ථානමාරු ලබා දීමේදී මෙම තත්ත්වය මඟහැරී ඇත. | අතිරික්ත නිලධාරීන් ස්ථානමාරු කිරීම් තුළින් කාර්යමණ්ඩලයේ තුලනයක් සිදුකළ යුතුය. |
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවද, මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරින් 30 දෙනෙකු සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක සේවයේ නියුතු නිලධාරීන් 896 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දින වන විටත් වසර 06 සිට වසර 32 ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී තිබුණි. | නිලධාරීන් වාර්ෂික ස්ථාමාරුවීම් සඳහා අයදුම් කලද බොහෝ නිලධාරීන්ට වාර්ෂික ස්ථානමාරුවීම් ලැබී නොමැත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ නියමයන් ප්‍රකාරව ස්ථානමාරුවීම් සිදුකිරීමට කටයුතු කලයුතුය. |